# වස්සානය

රත්න ශ්‍රී විජේසිංහ

කොළඹ යුගය - නූතන පද්‍ය

# ජීවන තොරතුරු

- උපන් දිනය :- 1953.06.02
- උපන් ස්ථානය :- දකුණු පළාතේ ,නාකියාදෙනිය තෙල්ලඹුරේ ග්‍රාමයේ දී.
- අධ්‍යාපනය ලැබූ ආයතන :-
  - නාවල රජයේ පාසල
  - තෙල්ලඹුර විද්‍යාකාන්ති විදුහල
  - තෙල්ලඹුර දුටුගැමුණු විදුහල

  (ඉහත පාසල් තුන) — ප්‍රාථමික අධ්‍යාපනය

  - හික්කඩුව ශ්‍රී සුමංගල විදුහල - ද්විතියික අධ්‍යාපනය
  - ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය - විද්‍යා අංශයෙන් උසස් පෙළ
  - පේරාදෙනිය විශ්වවිද්‍යාලය - සිංහල විෂය ගෞරව උපාධිය
  - කැලණිය විශ්වවිද්‍යාලය - ශාස්ත්‍රපති උපාධිය

# එතුමා යෙදී සිටි වෘත්තීන්

- ගුරුවරයෙකි,
- දකුණු පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා ඒකකය භාරව කටයුතු කිරීම.
- උණවටුන අමරසූරිය ගුරු විද්‍යාලයේ කථිකාචාර්යෙකු ලෙස,
- අමාත්‍යාංශ කිහිපයකම ජ්‍යෙෂ්ට සහකාර ලේකම් තනතුර,
- පුවත්පත් කවි පිටු සංස්කාරවරයෙකු ,
- රූපවාහිනී, ගුවන්විදුලි වැඩසටහන් සම්පාදකයෙකු,
- තීරු ලිපි, විශේෂාංග ලිපි සම්පාදකයෙකි. ( පුවත්පත් කලාව )

# රත්න ශ්‍රී විජේසිංහයන් ගේ කාව්‍ය ග්‍රන්ථ -

- බිය නොවන් අයියණ්ඩි ( 1975 - ප්‍රථම කාව්‍ය සංග්‍රහය )
- වස්සානේ
- සුබ උදෑසන ( 1988 රාජ්‍ය සම්මාන )
- සල්ගහයට ( 1996 )
- තරු ලකුණ ( 1997 - ගොඩගේ සම්මාන )
- මධ්‍යමයාමය ( 2004 - ගොඩගේ සම්මාන )
- සංධ්‍යාතීර්ථය - 2010

# රත්න ශ්‍රී ගේ ගීත සංග්‍රහය

- වංකගිරි අරණේ ( 1990 රාජ්‍ය සම්මාන )
- සුදු නෙළුම ( 1993 රාජ්‍ය සම්මාන )
- ගංගා ගීතය ( 1995 )
- ඉරබටු තරුව ( 1998 )
- නෙත නිලුපුල් ( 2002 - රාජ්‍ය සම්මාන )
- ආලකමන්දාව ( 2008 - රාජ්‍ය සම්මාන )

# රත්න ශ්‍රී ගේ ළමා කෘති

- සැළලිහිණියෝ
- රන්කිරිකට
- රතු කිකිළි
- සිංදු කියන උණ පඳුර - රාජ්‍ය සම්මාන
- ළහිරු මඩල - සූරිය උදාවනතුරු
- ගල් අරමේ ඇතින්නියා
- පැණි කුරුල්ලෝ

# රත්න ශ්‍රී ගේ ජනප්‍රිය ගීත

- මගේ බිසවුනේ අසාපන්
- කිරුළ මුතු ලිහී - සර සර හඬින් වැගිරෙනා
- චන්ද්‍ර මණ්ඩලේ සැඟවුණ පුංචි සාවියේ
- බිම්බරක් සෙනග ගැවසුන
- ලෙංචිනා මගේ නංගියේ
- අජානේය ස්කූටර
- ගංගාවක් වී ගලන්න
- පුන්සඳ රැට ඇවිදින්
- මගෙ දුවේ ඔබ අවදියෙන්නම්

# එතුමාගේ ශාස්ත්‍රීය ග්‍රන්ථ

- මහගමසේකර හා සමාජ යථාර්ථය ( 1994 ) මහාචාර්ය සුචරිත ගමලත් මහතා සමඟ.

- ලස්සන ම අහස හා මතක සිතුවිලි

# ඔහුගේ වෙනත් ලේඛන කටයුතු - ලිපි සංග්‍රහ

- ලියවැල
- අත්පසුර
- කටුගහ යට
- සංවාද

# ඔහු ගේ නිර්මාණ දිවිය පිළිබඳ විවරණය

රත්න ශ්‍රී නවකවියේ චන්ද්‍රෝදය

# ලැබූ සම්මාන

“ ජපන් බුන්කා ”     සම්මානය

# රත්න ශ්‍රී ගේ පද්‍ය රචනා

- වංක ගිරියට මාරු වීම
- අම්මේ පෙම්බරා
- අම්මාගේ සාක්කිය

කවියෙක් /ගීත රචකයෙකු ලෙසින්
ප්‍රසිද්ධියට පත් වූ රත්න ශ්‍රී ගේ කවියක්
මුල්වරට පළවූයේ ‘ ගීතාංජලී’ කවි පත්‍රයේය

# රත්න ශ්‍රී ගේ කාව්‍යකරණයේ විශේෂතා

- . බස හැසිරවීමේ සූරතාව
- අනුභූතීන් කාව්‍යගත කිරීමේ දී පෙන්වන  දෘෂ්ටිය
- සමාජ  යථාර්ථය පෘථුලත්වයට  පත් කිරීමේ අවශ්‍යතාවය
- මානව දයාව හා භක්තිය
- භාවගෝචර අත්දැකීම් මත කවිය පිහිටුවීම
- ඔහු සිය කවිය තුළ වචන සිරකර තබන ආකාරය පාඨක ග්‍රහණයට හේතුවේ.
- කවිබස (කදිම හා නැවුම් අපූර්වත්වයක් ඇති කරයි )

01. ඔය දැල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

වැසි ජලයෙන් පිරී ගිය ඔයේ ජල පහර වේගවත්ය. දැලෙහි ( ඔයේ ඉවුරු දෙකෙහි ) ජල පහර වදින හඬ නොකඩවා ඇහෙයි. කවියා ඒ සියල්ල පැවසුයේ වචන දෙකකිනි. එනම් " ඔය දැල දොඩමලුය" යනුවෙනි. 'ඒ ඉවුරත් මේ ඉවුරත් දොඩමලුය' යනු ඒ අන්‍යාලාපයයි. 'හොඳම වචන හොඳම පිළිවෙලට යෙදීමෙන් කවිය බිහි වේ'. යනුවෙන් එස්.ටී.කොල්රිජ් නම් විචාරකයා පැවසූ දේ සත්‍යයක් බව රත්න ශ්‍රී ගේ 'වස්සානය' අපට පසක් කරයි.

කවියා මෙහිදී හරිම සුවඳයි නොකියා "සුවඳ බැරුවා ඉන්ට "යනුවෙන් පවසන්නේ සුවදෙහි තරම ප්‍රමාණයෙන් කිව නොහැකි තරමටම සුගන්ධවත් බැවිනි. මුල් කවි දෙපදම ජනවහරින් පෝෂිතය.

තුරුලු කරගෙන සිටින නිල් පාට වතුර (පිරිසිදු දිය ) කද කෙසේ නම් අතහැර යම්ද? කෙකටියා පඳුරේ සුදු පාට මල් පිපී තිබේ. මල් පොකුර දරාගෙන නොව වඩාගෙනය. වඩාගෙන යනුවෙන් යෙදීම තුළ භාවික ගුණය හා ධ්වනිය වඩාත් ඉස්මතු වී තිබේ. කෙකටියා මල් නිසල ජලයේ පිපීම ස්වාභාවික සංසිද්ධියක් වුවත්,අන්‍යාකාරයෙන් දැක්වීම තුළ උත්ප්‍රේක්ෂාලංකාරය ඇති කරයි.

අවසාන පදයේ දී සොඳුර යනුවෙන් කවියා අමතන්නේ ගලා බස්නා ඔයේ ජල දහරාවයි. සිහින් සිනහව අව්‍යාජ ය.

වඩාගෙන, සොඳුර, දොඩමලුය යන වදන් තුළින් සජීවීත්වය ඉස්මතු වේ. එළිසමය රහිත සිව්පද ආකෘතියකි. පස්මත් විරිත (අඹහැලි විරිත නමින්ද හැඳින්වේ).

පාදවල මාත්‍රා සමාන නිසා සිව්පද විරිත ලෙසද හැඳින්වේ.

02. කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද
පුර පසේ සඳ එක්ක තරගයට මෝරන්ට
හුලන්දා ඔය කිමද මල්වර ව ඉලමහට

වස්සාන සමය බැවින් ඔය දෙ ඉවුරේ වැවුණු කුඹුක් ගස්වල අතු ජලයෙහි ගෑවෙන තරමට ජල මට්ටම ඉහල ගොසිනි. කුඹුක් ගස් හා ජලය අතර පවත්නා ස්වාභධර්මයේ පවත්නා මනා සබැඳියාව කවියා කවි ඇසින් අපූර්වාකාරයෙන් දකියි. එය ජන බසින් පෝෂණය කරමින් උත්ප්‍රේක්ෂාලංකාරයෙන් අලංකාරකර තිබේ. අතු වතුරෙහි ගෑවෙනවා නොවේ. “ අතගගා ” යනුවෙන් යෙදීමෙන් මෘදු ස්පර්ශය භාවයන්ට හැඟීම් දනවන අයුරින් කවියාද මෙම අවස්ථාව රසික මනසට හා කයට භාවාත්මක ආස්වාදය කැටිකොට ඇති සෙයකි. කවියා අචේතනික අතු වලින් විමසන්නේ,සචේතනික මාළුවෝ දිය ක්‍රීඩා කරන හැටි දුටුවා ද යනුවෙනි. පුරපසේ සඳ දිනෙන් දින මෝරා වැඩෙයි. පිරිපුන්ය.එම සඳ එක්ක තරගයට වගේ යනුවෙන් උපමාවක් සඟවා තබමින් ප්‍රකාශ කරන්නේ ,ඉල්මහේ මල්වර වූ හුලංදා ඔය සඳ සමග තරග වදිනසේය.මල්වර වූ දැරියක් පිරිපුන්ය. ලස්සනය. වැසි ජලයෙන් පිරී ගිය හුලංදා ඔයත් පිරිපුන් වී ඇත්තේ එපරිද්දෙනි. ධ්වනි පූර්ණ, භාවාත්මක හැඟීම් උද්දීපනය කරන අපූරු පද සංඝට්ටානවකි. රත්න ශ්‍රී හුලංදාව විදුහලේ සේවය කරන කාලයේ ලැබූ අත්දැකීමක් මෙසේ අපූර්ව පබැඳුමක් වන්නට ඇත.

03. සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ
දිය නිලන වැසි සමේ රැලිනගා උතුරාය
තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබෙ සිනාවෙන් නිවේ හුණු ව ගිය ලේ නහර

මෙම කවියේ දී කවියා හුලංදා ඔයෙන් නිල් පොකුණක් වෙත සහෘදයා කැදවාගෙන යයි. සෙනෙහසින් පිරීගිය ඔබේ ඇස් නිල් පොකුණට සමාන කරමින් රූපකාර්ථවත් යෙදුමකින් දක්වයි. නෙත් වල ඇති නිල් පැහැය මෙන් පිරිසිදු ජලය ද නිල් පැහැයෙන් දිස්වේ. සප්‍රාණික දෑස් තුළින් අප්‍රාණික නිල් පැහැය දකින ආකාරය අපූර්වය. වැසි සමයේ පිරිසිදු දිය පොකුණු රැලි නගිමින් උතුරා යයි. ( තඹර යනු නෙළුම් ය, හෙල්මැලි යනු සුදු මානෙල් මල් ය) නෙළුම් මල්වල පෙති ,මානෙල් මල්වල රේණු වැසි වසින්නාක් මෙන් ජලය මත පාවෙමින් තිබේ. අවසාන පද්‍යයේදී ඉඩෝර සමයේ සිරුරේ උණුසුම්ව තිබූ ලේ නහර (ග්‍රීස්ම සමයේ විඩාවට පත් ශරීරය ) සිසිල්ව ගියේ ඔබේ සිනාවෙන්( වැසි සමය ) බව පෙන්වා දෙයි.

04. දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟ ව
නිල් කුරුලු බිලිඳු නිදි ඇහරවන්නේ කුමට
රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය
මිහිරි මව් කිරි වගේ පොවන්නම් නුඹලාට

දෙවැට දිගේ කරඳවැල් ආරුක්කු මෙන් වැවී තිබේ. මෙම ආරුක්කු යට සැගව නිල් කුරුළු බිළින්දෝ නිදාගෙන සිටිති.

එහි සෙවණ හා සීතල පරිසරය කුරුළු බිළිදාට සුවපහසුව නිදා ගැනීමට සුදුසු ලෙස සැකසී ඇත. හිරු එළිය සැර වී කුරුළු බිළිදා ඇහැරේවි යන බියෙන් මෙන් කවියා එම හිරු එළයේ රශ්මිය පෙරා අඩුකර දෝතට රැගෙන " මිහිරි මව්කිරි වගේ " බිළිඳුන්ට පොවයි. හිරු එළිය මිහිරි මව්කිරි වගේ යනු උපමාවකි. මව්කිරි සත්වයන් පෝෂණය කරන්නාසේම තුරුලතා පෝෂණය කරන්නේ හිරු එළියයි . ස්වභාවික පරිසරයට කවියාගේ පවත්නා ඇල්ම මෙම කවියෙන් මනාව පසක් වෙයි. භාවාර්ථවත් හා ධවනිපූර්ණ වදන් මාලාවකි.

05. රමණීය වන ගැබෙහි මොනරුනට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

වස්සානයේ පිබිදුන වන ගැබට මනසින් පිවිසෙන කවියා අලුතෙන් පියාපත් වැඩෙමින් පවතින මොනරුන් ගැන ද පවසයි. මොනරුන්ට පිල් වියන සන්නාලියන් දේදුන්න කොහොම ඇන්දා ද? දේදුන්න පායන්නේ හීන් හිරිපොද වැස්සෙන් ආකාශය තෙමෙද්දීය. ඒ වැහි වතුර විහිළුවට ඉසිනවානම් නොතෙමී මා ළඟට වරෙන් යැයි කවියා කුරුල්ලන්ට පවසයි. මේ අයුරින් කවියා ස්වභාව ධර්මයේ සංසිද්ධීන් උත්ප්‍රේක්ෂාලංකාරව ඉදිරිපත් කරන්නේ රසික සිත් රසාලිප්ත ලෝකයකට ආසක්ත කරවමිනි.

06. වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින
දැන් ඒවි තැනි බිමට - සීතල යි මගෙ සිතට
වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න
ඔබ එන්න - ඉතිං මගෙ හෙට දවස මට දෙන්න

මොනරාගල සිටින කවියාට ඈත කඳුකරයේ කඳු වළල්ල දුරට පෙනෙන අතර එම කඳු පන්ති වැසි වළාවන්ගෙන් වැසී ඇති අයුරු දකියි. අප ද මෙවන් අත්දැකීම් කොතරම් නම් ලබා තිබේ ද? එහෙත් කවියා එම ස්වාභාවික සංසිද්ධිය අපූර්වාකාරයෙන් දකියි. කවියා වළාකුළු ‘රංචු ’ගස්වා කඳු පන්ති ‘ලගින්නට ’සලස්වා තිබීමෙන් වළාකුළු සජීවත්වයට නංවා උත්ප්‍රේක්ෂාලංකාරයෙන් අලංකෘත කර ඇත. සජීවීත්වයට පත් කළ වැහි වළාකුළු තව මොහොතකින් කන්දෙන් තැනිතලා බිමට එයි. ඒ සිතුවිල්ලම කවියාට සීතල දනවයි. වස්සානයේ මිහිරි සීතලට ගුලි වී සිහින දකිමින් නිදන්නට කවුරු නම් අකමැති වෙද්ද? කවියාට ද මෙම වැසි සමේ එකී ආශාවෙන් සිත ඔද්දල්ව ගොස් ඇති සෙයකි. වැස්ස සජීවී කොට තමන් කරා රෑ යාමේ ගෙන්වා ගන්නේ ඔබ එන්නැයි ඉල්ලීමක් තුළිනි ‘හෙට දවස මට දෙන්න’ යනුවෙන් ද කවියා ඉල්ලන්නේ පසු දින දහසකුත් වැඩපල කිරීමට තිබෙන බව සිහිපත් වූ බැවින් විය හැකිය. අන්තිම පාදය වක්‍රෝක්ති ගත කරන කවියා පොදු මානව ස්වාභාවය අපූර්වාකාරයෙන් දකියි.

07. ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව
ඇදි ඇදී ඉක් ගැසූ ගඟ නැවත පිරිපුන් ය
දුෂ්කර ය කියා හැර යා යුතු ද ජීවිතය ?
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

ගෙවුණු ග්‍රීස්ම සමයෙ හි දී ගංගාව සිඳී ගියේ ය. ඉතිරි වූයේ කුඩා දිය පහරකි. රත්න ශ්‍රී එම ගංගාවට ජීවය කැටිකොට දෙයි. ශරීරය කෙට්ටු වී ,සුදුමැලිව අබල දුබල වී ඇවිද ගන්නටත් බැරිව කෙඳිරිගාමින් සිටින වියපත් මහළු රුවක් සේ දිය සිඳී ගිය ගංගාව කවියා දකියි. වස්සානය එළඹී කල්හි මරණය පෙනි පෙනී හුන් ගංගාව යළි ජීවය ලබමින් පිරිපුන් ව ව වැඩෙන අයුරු කවියා දකියි. අනතරුව යෙදෙන අවසාන පද්‍ය දෙකෙන් අපට ජීවිත යථාර්ථය පසක් කරවයි.

දුෂ්කර ය කියා හැර යා යුතු ද ජීවිතය

කටු පොකුරු සිප ගනිමි හෙට මලක් වනු පිණිස

කවියාගේ උදාන වාක්‍යය මෙයයි. අපගේ ජීවිතයට කුමනාකාරයේ දුෂ්කරතා පැමිණිය ද ඉන් කලකිරී ජීවිතය හැරදා යා යුතු නැත.අප අද ඒ දුෂ්කරතා පිරුණු ජීවිතයට ශක්තිමත්ව මුහුණ දීමෙන් අනාගතය සාර්ථක කරගත හැකි බව කවියා පවසන්නේ ස්වභාවධර්මය තුළ ඇති වස්තූන්ට ජීව ගුණය අපූර්වාකාරයෙන් කැටි කරවමිනි.

කවියා ඔහු තුළ පවත්නා සෞන්දර්යකාමීත්වය තුළින් ස්වාභවධර්මයේ වස්තූන්ට ජීව ගුණය කැටිකර සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව කරා කැඳවාගෙන යයි.

ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය -රූපකාර්ථ ඇදි ඇදී - අනුප්‍රාස

# වස්සානය

- රූපකාර්ථ සහ සංකල්ප රූප බහුලය
- සම්භාව්‍ය බස
- ජන කාව්‍ය බස
- කට බස

මනා සම්මිශ්‍රණයකි.

සැකසුම -
W.S.V.K.විජයසිරි
කෑ/හකහින්න මහා විද්‍යාලය